tamilguru.lk



# උතුරු පළාතේ පාසල්වල දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් වූ විෂයයන් හි පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තිය – I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – *2023*

උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක NP3/1/4/Gra.Tea/2023 හා 2023.09.18 දිනැති ලිපිය මගින් ජේ‍්‍යෂ්ඨ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක ED/02/29/21/AL/02-vi වෙඑම, 2023.07.24 දිනැති, ලිපිය උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරගේ 2023.10.13 දින දරණ අනුමැතිය හා 2021.01.26 දිනැතිව නිකුත් කරන ලද අංක 2021/01 දරණ ගරු ආණ්ඩුකාරවරගේ සංදේශය මගින් නිකුත් කර තිබෙන බලතල පැවරීමට ද යටත්ව උතුරු පළාත් පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පන්තිය 3 - I(අ) ශ්‍රේණියේ තනතුරට **ඇමුණුම–01**හි සඳහන් පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. **ඇමුණුම–02**හි දක්වා ඇති පරිදි නියමිත විෂයයන්ට අදාළ සුදුසුකම් සපුරා තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ. **ඇමුණුම–01**හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීපමි විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **03.11.2023** වේ.

## *02.* බඳවා ගැනීමේ සේවා කොන්දේසි

2.1 **අංක** 1885/38 දරණ 2014.10.23වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යාවස්ථාවේ නිර්දේශිතව තිබෙන කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටි සංග්‍රහයට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් නියමිත තනතුරේ පන්තිය 3 - I(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. මෙම බඳවාගැනීම් මගින් තෝරා ගන්නා අපේක්ෂයන් පත්වීම් දින සිට වසර තුනක පරිවාස කාලයට යටත් කර පත් කරනු ලැබේ

2.3 මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයක් වන අතර මෙම තනතුරට පත්වන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්ව බැඳී සිටිය යුතුයි.

2.4 පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලබයි. නිවේදනය කර තිබෙන පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩුවක් හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලතල ද පත්වීම් බලධාරියා සතුය.

2.5 පත් කරන පාසල සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරන ඕනෑම තීරණයකට අයදුම්කරුවන් යටත්විය යුතු

2.6 අංක 18/2020 හා 2020.10.16වන දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව රාජ්‍ය භාෂා කුසලතාව සම්පූර්ණ කළ යුතුයි.

## *03.* වැටුප් පරිමාණය

පන්තිය 3 - I(අ) ශ්‍රේණියේ තනතුරට අලුතින් බඳවා ගනු ලබන ගුරුවරයකු පත්වීම් බලාත්මක වන දින සිට අංක 03/2016(iv) දරණ 2022.08.05**වන දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව**, **GE 1-2016-A දරණ වැටුප් සංකේත අංකය යටතේ රුපියල්** 31490 – 445x 6 – 525 x 7 – 600 x 2 – 39,035 **ක** මාසික වැටුප් ප්‍රමාණයේ 14වන වැටුප් පියවර වන රුපියල් **37,835/-**හි පිහිටුවනු ලැබේ. මීට අතිරේක වශයෙන් රජයේ නිලධාරීන් හට කලින් කලට ගෙවන දීමනා ද ලබා ගැනීමට හිමිකම් ඇත.

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1 අපේක්ෂකයා ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 එමෙන් ම අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර මෙම අයදුම්පත් කැඳවන අවසාන දිනට ප්‍රථම වසර හයක(06) කාලපරිච්ඡේදයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටිය යුතුයි.

**නැතිනම්**

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපත ලබා තිබිය යුතු අතර අවම වශයෙන් අවුරුදු පහක්(05) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**(සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද නාමලේඛණයෙන් උපුටා ගන්නා ලද සහතික කළ නාමලේඛණය ඉදිරිපත් කළ යුතුයි)**

04.3 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සරිලන පරිදි ශාරීරික හා මානසික වශයෙන් නිරෝගිව සිටින යුතු අතර මනා චරිතයකින් යුත් තැනැත්තියක් හෝ තැනැත්තෙක් විය යුතුයි.

04.4

*04.4.1.1* අයදුම්කරුවෙකු බඳවා ගැනීමේ නිවේදනයට අනුව **එක් අයදුම්පත්‍රයක්** පමණක් ඉදිරිපත් කළ යුතුයි.

*04.4.1.2* අයදුම්කරුවෙකු අයදුම් කළ යුත්තේ උපරිම විෂයයන් දෙකකට පමණයි (එක් විෂයය මාධ්‍යයකින් පමණක්). එමෙන්ම තෝරාගත් විෂයයන් පසුව මාරු කළ නොහැකිය.

***04.4.1.3* අයදුම්කරුවෙකු, පුරප්පාඩු වී තිබෙන පාඨම කුමක් ද ඊට අයදුම් කරන්නේ නම්, එම භාෂා මාධ්‍යයෙන් ම විභාගයට පෙනී සිටිය හැකිය.**

*04.4.1.4* මනාප තේරීම් ප්‍රමුඛත්වය පදනම් කරගෙන විෂයයන් තෝරා සඳහන් කළ යුතුයි.

*04.4.1.5* අභියෝග්‍යතා පරීක්ෂණයට තෝරා ගන්නා අපේක්ෂකයන්, අයදුම්පත්‍රයේ කලින් සඳහන් කළ බඳවා ගැනීමට අදාළ භාෂා මාධ්‍යයෙන් පෙනී සිටිය යුතුයි.

*04.4.1.6* අප විසින් කැඳවා ඇති ගුරු තනතුරේ පුරප්පාඩු සඳහා සුදුසුකම් තිබෙන විෂය ඒකක සම්බන්ධයෙන් සැකයක් මතුවන විට ඒ පිළිබඳව පත්වීම් බලධාරියාගේ / පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ

04.5 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම සුදුසුකම් සියල්ල අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි.

04.6 වයස් සීමාව :-අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට **නොඅඩු හා අවුරුදු 35ට වැඩි නොවිය යුතුයි**.

## 05. අධ්‍යාපන සුදුසුකම් :-

05.1 **අංක** 1885/38 දරණ 2014.10.23වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව 2023.11.03 **වන** දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් ගුරු පත්වීමට අදාළව අනුමැතියලත් විශේෂ විෂයයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි පිනැමීමේ ආයතනයක් මඟින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල සුදුසුකම්ලත් උපාධි සහතිකය (**ඇමුණුම-02හි දක්වා ඇති පරිදි**) හිමිව තිබිය යුතුයි. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඉදිරිපත් කරන අයදුම්පත්‍ර හා කැඳවා ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2 ඉහත සුදුසුකම් වලට අමතරව අපොස (සා/පෙ) විභාගයෙන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සමත්වී තිබිය යුතුයි.



tamilguru.lk

## 06. බඳවාගන්නා ක්‍රමය

06.1 තරග විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා අවම ලකුණු 40% ක් ලබා සුදුසුකම් ලබන අපේක්ෂකයන් ගෙන් සම්පූර්ණ ලකුණු අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන පරිදි සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී කැඳවන ලද තනතුරට අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරන්නේ නැති අතර සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් ලබන අපේක්ෂකයන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. **11.2හි සඳහන්** කර ඇති පරිදි ප්‍රායෝගිය පරීක්ෂණයට ලකුණු ප්‍රදානය කරනු ලැබේ. ප්‍රායෝගිය පරීක්ෂණය, ලිඛිත පරීක්ෂණය යන පරීක්ෂණ වලදී ලබාගත් සම්පූර්ණ ලකුණුවල මුළු එකතුවේ අනුපිළිවෙළට (Merit Order) පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

06.2 ඉහත 06.1හි සඳහන් සුදුසුකම් සපුරා තිබෙන විශේෂ අවශ්‍යතා තිබෙන්නන්ට(ආබාධිත) පුරප්පාඩුවෙන් 03%ක් වෙන්කරනු ලැබේ. විභාග අපෙක්ෂකයන් පත්වීම සඳහා තෝරාගනු ලබන විට තනතුර දැරීමට තම ශාරීරික හා මානසික තත්වය බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මඟින් සනාථ කළ යුතුයි.

## 07. විභාග ගාස්තු

අයදුම්කරුවන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක රුපියල් 500ක් ගෙවා **"ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු පළාත"** යනුවෙන් සඳහන් කර **"3401"තැන්පත් ගිණුමට** ගෙවූ වට්නාකමේ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසාවත් මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා ද මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමය

08.1 මෙම නිවේදනය සමඟ අනුයුක්ත කර ඇති අයදුම්පත්‍රය තම අත් අකුරුවලින් පුරවා සකස් කර සම්පූර්ණ කරන ලද එම අයදුම්පත්‍රය 2023.11.03 වන දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන පරිදි**"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත්‍රයේ 01 කොටස යටතේ අයදුම්කරුගේ නම සඳහන් කරන විට තමාගේ නම සටහන් කර ඉතිරි නම් වල මුලකුරු ඉන්පසු ක්‍රමවත් ලෙස යෙදිය යුතුයි. අයදුම්පත්‍රයේ අංක 02 යටතේ අයදුම්කරුගේ සම්පූර්ණ නම සඳහන් කරන විට තම නම යටින් ඉරක් ඇඳිය යුතු

**උදාහරණයක් වශයෙන්** :- අයදුම්පත්‍රයේ කොටස 01හි සම්පූර්ණ නම Kumari L. යනුවෙන් සඳහන් කළ යුතුයි.(අයදුම්කරුගේ නම Kumari)

අයදුම්පත්‍රයේ 02වන අංකය යටතේ නම <u>Kumari </u>Liyanage යනුවෙන් සටහන් කළ යුතුයි

**08.3** අයදුම්පත්‍රය යොමු කරන ලිපිකවරයේ වම් උඩු කෙළවරේ **"ශ්‍රී ලංකා ගුරු සේවයේ පන්තිය 3-I(අ)ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය –2023"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.4 අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් ළඟතබා ගැනීම ඔබට ප්‍රයෝජනවත් විය හැකි අතරම අයදුම්පත්‍රයේ ඡායාපිටපත් හෝ පූර්වනිශ්චිත පිටපත් පිළිගන්නේ නැත. විභාග ප්‍රවේශ පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සුදුසුකම් සියල්ල සපුරා තිබෙන බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුයි.

08.5 අයදුම්පත්‍රය යොමු කර තිබෙන අයදුම්කරුවන්ගෙන් කවුරුන් හෝ අපේක්ෂකයකුට විභාගයට දින 07කට පෙර හෝ ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැත්නම් වහාම පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට තම අභියාචනය ඉදිරිපත් කළ යුතුයි. **(දුරකථන අංකය – 021 221 9939, ෆැක්ස් අංකය - 021 221 9940)**

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු :**
තොරතුරු ඇතුළත් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායාපිටපත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයකි.

08.6 **අයදුම්කරුවන් සියළු දෙනාම තම තමන්ගේ අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වන අතර** රජයේ ආයතනයකින් අයදුම්පත් යොමු කරන අපේක්ෂක විසින් තම ආයතනයේ ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් යෙදීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශන නිලධාරී, නීතිඥවරයෙකු, නොතාරිස්, නාවික හමුදා, යුධහමුදා, ගුවන්හමුදා බලයලත් නිලධාරීන් රුපියල් 498,960.00ක වටිනාකමට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ මධ්‍යම හෝ පළාත් සේවයේ නිලධාරියෙකු, ආගමික මධ්‍යස්ථානයන් භාරව කටයුතු කරන ආගමික නායකයන් යන අයවළුන්ගෙන් එක් අයෙකු තම නිල මුද්‍රාව මඟින් සහතික කළ යුතුයි.

***09.* විභාග අපෙක්ෂකගේ අනන්‍යතාවය**

මෙම විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම තම තමන් පෙනී සිටින එක් එක් විෂයයන් සඳහා අධීක්ෂණ නිලධාරියා සෑහීමට පත්වන පරිදි තම තමන්ගේ අනන්‍යතාවය සනාථ කළ යුතු අතර අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එක් ලියවිල්ලක් ඉදිරිපත් කිරීම සෑහේ.

(i) පුද්ගයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එක් ලියවිල්ලක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය**"ලේකම් රාජ්‍ය සේවා කොමිෂම් සභාව උතුරු පළාත"** විසින් අහිමි කරනු ලැබේ. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතීන් ට සියළුම අපෙක්ෂකයන් නැඹුරු විය යුතුයි.

***10.* ව්‍යාජ තොරතුරු සඳහා අඩුවම**

අයදුම්පත්‍රය සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතු සැපයීමට වගබලා ගත යුතුයි. උක්ත විභාගයේ රීතින්ට අනුව කවුරුන් හෝ අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විටදී හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබෙන අතර අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් ව්‍යාජ තොරතුරක් බව පත්වීමෙන් පසු අනාවරණය වනවිට පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබේ.

***11.* විභාග සැලැස්ම**

11.1 **ලිඛිත විභාගය**
පහත සඳහන් පරිදි මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සමන්විත ප්‍රශ්න පත්‍රයකි. දෙමළ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන් මඟින් පැවැත්වෙනු ලැබේ. දෙමළ මාධ්‍යය මඟින් වූ ගුරු පුරප්පාඩු සඳහා දෙමළ මාධ්‍යයෙන් ද, සිංහල මාධ්‍යය මඟින් වූ ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් ද ඉංග්‍රීසි මාධ්‍යය මඟින් වූ ගුරු පුරප්පාඩු සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද, විභාගයට පෙනී සිටිය යුතුයි විභාගය සඳහා අයදුම්පත්‍රයේ සඳහන් කරන මාධ්‍යය වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ

| අංක | ප්‍රශ්න පත්‍ර | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | යෝග්‍යතා පරීක්ෂණය | විභාග අපේක්ෂකයන්ගේ ගුරු වෘත්තිය සඳහා දක්නට ලැබෙ හැකියාවන් තර්කානුකූල දැනුම සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමට පහසුවන පරිදි ප්‍රශ්න සංඛ්‍යා 50කින් යුතුවේ. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම | විභාග අපේක්ෂකයන්ගේ ගුරු ක්ෂේත්‍රයට අදාළව දක්නට ලැබෙ සාමාන්‍ය දැනුම, අභ්‍යන්තර රට තුළ ඇතිවී තිබෙන හා ඇතිවිය හැකි අධ්‍යාපන ප්‍රගතිය සම්බන්ධයෙන් සාමාන්‍ය දැනුම හා අධ්‍යාපනයේ නවීකරණය වැඩසටහන් සම්බන්ධයෙන් වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමට අදාළව බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමට පහසුවන පරිදි සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි ප්‍රශ්න සියල්ලට පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහාම වෙන් කරනු ලබන ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක ප්‍රතිශතයක් (40%) විභාග අපේක්ෂකයන් ලබාගත යුතුයි.

### 11.2 **ප්‍රායෝගික පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගි පරීක්ෂණය දී අපේක්ෂකයා විසින් හඳුනාගන්නා මාතෘකාව යටතේ තම ඉදිරිපත් කිරීම් කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු පිරිනමනු ලැබේ.

| ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු පිරිනමන සැසඳීම් | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 01. අරමුණ හා ප්‍රවේශය **(Objective and the Approach)** | 05 | 02 |
| 02. නායකත්වය හා පාලනය **(Personality and Voice Control)** | 05 | 02 |
| 03. සන්නිවේදනයේ පැහැදිලිභාවය **(Clarity in the Communication)** | 05 | 02 |
| 04. කාල කළමනාකරණය **(Time Management)** | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය **(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| **සම්පූර්ණ ලකුණු** | **25** | **10** |

## 12. **විභාග ප්‍රතිඵල** :-

විභාග අපේක්ෂකයන්ට විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂම් සභාවෙ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවෙ වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ලැබේ.

**13. විභාග මධ්‍යස්ථාන :-**

විභාගය පැවැත්වීමට අපේක්ෂා කරන ලද විභාග නගර හා අංක පහත සඳහන් පරිදි වේ,

| ***නගරය*** | ***නගර අංකය*** |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |

විභාග නගරයක් වෙනුවෙන් ලැබෙන අයදුම්පත් වල සංඛ්‍යාව අපේකෂා කළ සංඛ්‍යාවට වඩා අඩු නම් එම විභාග නගරය ආසන්නයේ ඇති විභාග නගරයට මාරු කිරීමට අවස්ථාව ඇත.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා සතු වන අතර මෙම නිවේදනයේ දෙමළ,සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨයන් අතර යම්කිසි අනනුකූලතාවයක් දක්නට ලැබෙන අවස්ථාවකදී දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුකූලව කටයුතු කළ යුතුයි.

**සි, තිරුවාකරන්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
2023.10.13